
ආරම්භය: **1945-09-30** ලි.ප. අංකය: කො **39/482**
දෙහිවල, සුදර්සන පාරේ. ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි දෙහිවල බෞද්ධෝදය සංගමය
මගින් ධම් දානම පිණිස සැම පුර පසළොස්වක පොහෝ දිනයක්
පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.



# බෞද්ධෝදය

"ධම්මො හවේ රකඛති ධමමචාරි"

71 වර්ෂය - ශ්‍රී බු,ව 2560 2016 අගෝස්තු 17 නිකිණි කලාපය

**කොළඹ දිස්ත්‍රික් පාලි ගුරු උපදේශක,රත්මලාන**
**ශ්‍රී ධර්මාරාම පුරාණ විහාරවාසි**
**රාජකිය පණ්ඩිත ශාස්ත්‍රපති**
**පුජ්‍ය කොටනෙළුමේ පුඤ්ඥානන්දහිමිපාණෝ**

## ඇසළ මසෙන් උදාවන අපේ කඨින පින්කම්
## (දෙවන කොටස )

### වස් ආරාධනා කරන්නේ වසරේ කුමන කාලයක ද?

අපි හාමුදුරුවන් වහන්සේට වස් ආරාධනා කරන්නේ කුමන කාලයකද යන්න දැනගැනීම ද වැදගත් කරුණකි. වසරේ ඇසළ පොහොයට පසු දින හෙවත් ජුලි මස පොහෝ දිනට පසුදින පෙර වස් සමාදන් වන භික්ෂූන් වහන්සේලා වස් සමාදන් වෙති. උන්වහන්සේලා පොහොය කිරීම (ඇවැත් දෙසීම් ආදිය කොට) ඒ සඳහා සූදානම් වෙති. පසුවස් සමාදන් වන භික්ෂූන් වහන්සේලා නිකිණි පොහොයට පසුදින නොහොත් අගෝස්තු මස පොහෝ දිනට පසු දින පසුවස් සමාදන් වෙති.

පසු වස් සමාදන් වන භික්ෂූන් වහන්සේලාට අපි ආරාධනා කල යුතු නැත. අප වස් ආරාධනා කරන්නේ පෙරවස් සමාදන් වන භික්ෂූන් වහන්සේට පමණි. පසු වස් සමාදන් වන්නේ පෙර වස් සමාදන්වීමට නොහැකි වූ හාමුදුරුවන් වහන්සේලා පමණි. එසේ පසුවස් සමාදන් වූ භික්ෂූන් වහන්සේ නමකට කඨින සිවුරක් භාරගැනීමට හැකියාවක් නැත. එනිසා අප පෙරවස් සමාදන් වන භික්ෂූන් වහන්සේ නමකට ආරාධනා කිරීම කළ යුතුය. බොහෝවිට සිදුවන්නේ ඇසළ පොහෝ දින වස් ආරාධනා කිරීමයි. අප වස් ආරාධනා කළ පසු භික්ෂූන් වහන්සේ වස් සමාදන්වීම නියමිත දිනට එනම් පොහොයට පසු දින සිදු කරති.

එසේ පෙර වස සමාදන් වන භික්ෂූන් වහන්සේ තුන්මසකට පසු එනම් ඔක්තෝම්බර් මස නොහොත් වප් මස දක්වා වස් වසා වැඩ වාසය කරති. එම පොහෝ දින වස් පවාරණය කරති. ඉන් අනතුරුව වප් පෙහෝදින පටන් ඉල් පොහෝය දක්වා මාසය ඇතුළත කඨින පින්කම සිදු කරයි. එම කාලය චීවර මාසය ලෙසන් ද හැඳින්වේ. ඒ සිවුරු පුජා කරන මාසය නිසයි.

**වස් ආධනා කළ දායකයා තුන්මාසයක්ම සිව්පසය පිළිගැන්විය යුතුද?**

වස් තුන් මාසය තුළ හාමුදුරුවන්ට සිව්පසයෙන් සංග්‍රහ කිරීමට පොරොන්දු වු පසු චීවරයක් පූජා කරන්නේ වස් අවසානයේදීය. අප කඨින සිවුර කියා පූජා කරන්නේ එම සිවුරයි. ඒ අනුව චීවර පූජාව සිදු කරනු ලබයි. එහෙත් අනිත් පින්කම් මුල පටන්ම සිදු කරයි. පිණ්ඩපාත යනුවෙන් මෙහි අදහස් කරන්නේ දානයයි. වස් වසා වැඩ සිටින හාමුදුරුවන් වහන්සේට දායකයන් විසින් වස් කාලය තුළ දානය ගෙනත් පූජා කළ යුතුය.

හාමුදුරුවන්ට වස්කාලයේ පිණ්ඩපාතයේ වැඩම කිරීම කැප නැත. එනිසා දායකයන් මෙම කාලයේ අනිවාර්යෙන්ම දානය ගෙනත් පූජා කිරීම සිදුකළ යුතුය. සේනාසන පූජා කිරීම යනු හාමුදුරුවන් වහන්සේලාට වැඩ සිටිමට අවශ්‍ය ආවාසයක් පූජා කිරීමයි. වස්කාලයේ නිවසක වස් වසවා ගන්නේ නම් කාමරයක් එම කාලය තුල තම නිවසේ වෙන්කොට දීම සිදු කරයි. එහෙත් බොහෝ විට සිදුවන්නේ විහාරස්ථානයේ වැඩ සිටින ලෙස ආරාධනා කිරීමයි. එවිට අමුතුවෙන් ආවාස සෑදීමට අවශ්‍ය නොවේ. හාමුදුරුවන් වහන්සේලා එම විහාරස්ථානයේ හෝ ආරණ්‍ය සේනාසනයේ ඇති කුටියක හෝ ආවාසයක වැඩ සිටිති. එහෙත් අපේ දායක පින්වත්තු වස් කාලය අවසානයේ කඨිනයට පෙර විහාරස්ථානය හුණු පිරියම් කිරීම හෝ, තින්ත ගෑම, කැඩුණු බිඳුණු තැන් පිළිසකර කිරීම වැනි දේ සිදුකොට ආවාස පූජාව වෙනුවට ආවාස නඩත්තුවට හෝ දායක වීම සිදු කරති.

ගිලන්පස යනු බෙහෙත්වලට නමකි. අද අපේ බෞද්ධයෝ ගිලන්පස යනුවෙන් හඳුන්වන්නේ තේ, කෝපි, කිරි, සුප් හෝ හාමුදුරුවන් වළඳන පලතුරු බීම වැනි දේයි. එවැනි දේ ගිලන්පස ලෙස පූජා කිරීම ද වරදක් නැත. එහෙත් ගිලාන යනු ලෙඩාට කියන නමකි. පස යනු ප්‍රත්‍යයයි. ලෙඩාට දෙන බෙහෙත් ගිලන්පස වේ. එම නිසා හාමුදුරුවන් වහන්සේලාට වස් කාලය තුළ අසනිප වුවහොත් බෙහෙත් ගෙනවිත් දීම ආදිය සිදු කළ යුතුය. එය ගිලන්පස වලින් සංග්‍රහ කිරීමකි. ඒ අනුව දායකයා දිනපතාම නොව එම කාලය තුළ අවශ්‍ය වේලාව බලා තමන් සිවුපසයෙන් සංග්‍රහ කිරීම නියම පිළිවෙලයි.

**අපි වස් ආරාධනා නොකළොත් හාමුදුරුවන්ට මොකද වෙන්නේ.**

අපි පන්සලේ හාමුදුරුවන්ට මේ සැරේ වස් ආරාධනා නොකර සිටියහොත් හාමුදුරුවන්ට මොකද වෙන්නේ, යන්න සමහර කෙනෙකුට තිබෙන ප්‍රශ්ණයකි. හාමුදුරුවන්ට කිසිම දෙයක් සිදුවන්නේ නැත. සිදුවන්වෙන එකම දෙය නම් කඨින සිවුරක් අහිමි වීම හා දායකයාගෙන් ලැබෙන සිව්පසය නොලැබීම පමණකි. දායකයෝ ආරාධනා කළත් නැතත් හාමුදුරුවන් වහන්සේලා වස් සමාදන් විය යුතුය. එසේ නම් දායකයන් වස් වැසිමට ආරාධනා කරන්නේ කුමක් නිසාද? යන්න ප්‍රශ්ණයකි. දායකයන් වස් ආරාධනා කරන්නේ ඔවුන්ට පින් සිදු කරගැනීම පිණිසයි. හාමුදුරුවන්ට දායකයන් ආරාධනා කළත් නැතත් වස් සමාදන්වීම උන්වහන්සේලා සිදු කරති. දායකයෝ වස් ආරාධනා කොට තමන්ට පින් රැස්කර ගැනීමට මාර්ගයක් සකසා ගනිති.

## කඨින පෙරහැර කරන්නේ කොහොමද?

කඨින පින්කමේ විශේෂ අවස්ථාවක් වන්නේ කඨින පෙරහැර සිදු කිරීමයි. මෙය පෙර පටන් පැවත එන චාරිත්‍රයකි. විනය නිතී රීති අනුවකඨින සිවුර විහාරස්ථානයට රැගෙන එන්නේ පූජා කරන දිනයේය. ඊට පෙර කඨින සිවුරට අදාළ සිවුර හෝ වස්ත්‍රය මිලදීගෙන හෝ සකස් කොට ප්‍රධාන දායක මහතාගේ නිවසේ තබා ගනී. එය කඨින පින්කම දා උදේ අරුණ නැග එන අවස්ථාවේ විහාරස්ථානයට රැගෙන ඒම සිදු කරයි. කොස් කොළයේ නැට්ට පෙනෙන අවස්ථාව වන විට කඨින සිවුර පන්සලට රැගෙන ආ යුතු බව අපේ පැරැණි අයගේ මතයයි. එයින් ප්‍රකාශ වන්නේ ආලෝකය උදා වෙමින් එන අවස්ථාවයි.

මෙම සිවුරට පෙරහැරක් පවත්වන්ට හේතුව කුමක්ද? එදා මෙන්ම කඨින සිවුරට අත ගැසීමට අත ගැසීමට නොහොත් වන්දනා කිරීමට කවුරුත් ඉමහත් ආශාවක් දක්වති. මෙම කැමැත්ත වගේම තම නිවස ඉදිරිටයන් හෝ කඨින සිවුර රැගෙන යැම තමාට මෙන්ම තම ගමටත් ආශිර්වාදයක් ලෙස දායකයෝ විශ්වාස කරති. මේ නිසා කඨින සිවුර ගමේ පාරක් පාරක් ගානේ රැගෙන යැම සිදු කරයි. මෙය රැගෙන යන්නේ රාත්‍රී කාලයේ නිසා මේ සඳහා පන්දම් හෝ යම් ආලෝකයක් ද අවශ්‍ය වේ. පෙරහැර එන බව දැන්වීමට අවශ්‍ය වේ. ඒ සඳහා ශබ්ද කිරීමක් වශයෙන් හේවිසි නාද කිරීම සිදු කරයි.

මෙසේ බෙර ගසමින් පන්දම් රැගෙන සාධු නාද දෙමින් එදා ගමේ පාරක් පාරක් පාරක් ගානේ ගිය කඨින පෙරහැර අද වන විට සංවර්ධනය වී ඇත. ඒ සඳහා අලි ඇතුන් මෙන්ම බොහෝ නැටුම් කණ්ඩායම් ද ඇතිව තම විහාරස්ථාන වල හා දායකයන්ගේ වත් පොහොසත්කම් අනුව මහා ඉහළින් පෙරහැර පවත්වයි. අද වන විට මෙය හුදෙක් සංස්කෘතික උත්සවයක් බවට පත් වී ඇති අතර බොහෝ දෙනා තුළ තිබූ ශ්‍රද්ධාව අඩු වී ඇත. එදා සාධුකාර දෙමින් ඉතා ශ්‍රද්ධාවෙන් කඨින සිවුර රැගෙන ගිය උපාසක, උපාසිකා පිරිස වෙනුවට මත් වතුර බීගත් ගිණි බෝලකරුවන් සමග නටන, විසල් ගසමින් විනෝද වන තරුණ පිරිස් අපට අද දැකීමට ලැබීම කණගාටුවට කරුණකි. මේ සියල්ල දෙස බැලිමේ දී අපට සිතෙන්නේ අප පෙරහැරක් කරන්නේ කොහොමද? කියාය. අද වන විට කුඩා දරුවන් ද මල් බයිසිකල් රැගෙන යැමට ප්‍රියතායක් දක්වන බව පෙනේ. මෙයද දරුවන්ගේ අහිංසක බලාපොරොත්තුවකි. අප මේ පින්කම් කිරිමේ දී පොඩි දරුවන් ද සම්බන්ධ කරගත යුතුව ඇත. අලි ඇතුන් නැතිවට, ගිණිබෝල කරුවන් නැතිවට, ලොකු නැටුම් කණ්ඩායම් නැතිවට පින්කමේ කිසිම අඩුවක් නැති බව කිව යුතුය. අපට කළ හැකි ආකාරයට පෙරහැර කිරීම කළ යුතුය. එසේ නොමැතිව අල්ලපු පන්සලේ පෙරහැරට වඩා ලොකුවට කිරීමට කියා හෝ ගිය අවුරුද්දට වඩා ලොකුවට මේ අවුරුද්දේ කළ යුතු කියා හෝ තරගයක් අවශ්‍ය නොවේ. එසේ කිරීම තුළ ඇත්තේ තරගයක් මිස පින්කමක් නොවන බව සිත තබා ගත යුතුය. කඨින පෙරහැර යනු දායකයාගේ නිවසේ සිට විහාරස්ථානයට සිවුර රැගෙන ඒමයි. එය මල් පෙරහැරක් හා කොඩි පෙරහැරක් සමග ගියා ද වරදක් නැත. ඒවා තිබුණා කියා ද වරදක් නැත. එය මොන ආකාරයට කරනවාද කියා තමා තිරණය කරන්න. එය පින්කමක් ලෙස සිදු කිරිමට සිතනවා මිස උත්සවයක් ලෙස කිරීමට නොසිතිය යුතුය.

## කඨිනය උසස් පින්කමක් වෙන්නේ ඇයි?

කඨිනය පිළිබඳ හා එහි ආනිසංස පිළිබඳ අපට විස්තර දැක ගත හැකි වන්නේ නාගිත අපදාන පිළිබඳ විමසීමේදීයි. දිනක් බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා 500 නමක් අනෝතත්ත විල අසළට රැස් කරවූහ. එහිදී සංසාරේ විශේෂ පින්කමක් කළ අයකු සිටී නම් දන්වන ලෙස බුදුරජාණන් වහන්සේ සඳහන් කලහ. එහිදී නාගිත මහරහතන් වහන්සේ තමන් වහන්සේ සංසාරේ සිදු කළ කඨිනය පිළිබඳ දක්නට ලැබෙන හොඳම විස්තරය එයයි. නාගිත මහරහතන් වහන්සේ පැවසූ පරිදි උන්වහන්සේ ඊට පෙර විපස්සී නම් බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි බන්ධුමතී නුවර ඉසුරුමත් කුලයක ඉපිදී සිටියහ. එහිදී විපස්සී බුදුරජාණණ් වහන්සේ විසින් දේශනා කරනු ලැබූ කඨිනානිසංස ධර්ම දේශනාවක් අසා තමන් ද භික්ෂූන් වහන්සේට ආරාධනා කොට කඨින පින්කමක් කළේය. සිවුපසයෙන් භික්ෂූන් වහන්සේලාට උපස්ථාන කොට ඒ පිනේ බලයෙන් සසර සැප විඳ නිවන් දකින්නට එය හේතු වේවා කියා ප්‍රාර්ථනාවක් ද කලේය. ඒ පින්කමේ බලයෙන් කිසිදිනක සතර අපායක ඉපදුනේ නැත. දෙව් මිනිස් සැප විඳිමින් මේ දක්වා පැමිණි බව උන්වහන්සේ සඳහන් කළ සේක. උන්වහන්සේගේ එම විස්තරය අනුව කඨින පූජාවක් කළ අයට ලැබෙන ආනිසංස මෙලෙස දැක්විය හැකිය.

01. සංසාරයේ කිසි දිනක දුගතගාමී නොවීම.
02. සක්දෙව් පදවි ලැබීම.
03. දිව්‍යලෝක හා මනුෂ්‍යලෝක වල පමණක් ඉපදීම.
04. උපදින උපදින ප්‍රදේශයන්හි රාජ සම්පත් හෝ නායකයෙකු බවට පත්වීම.
05. සසර උසස් යැයි සම්මත කුලවල පමණක්ම උපත ලැබීම.
06. නිවනට පැමිණ වීමට තරම් විපාක ලැබීම.
07. සක්විති රජ සම්පත් ලැබීම.
08. පුරුෂයන් අතර උතුම් පුරුෂයකු වීම.
09. ඉතා ධනවත් වීම.
10. දෙවියන් අතර ප්‍රිය පුද්ගලයකු වීම.
11. සැම ආත්මයකදීම සියලු සැප සම්පත් හිමි වීම.